පත්‍රිකා මාලාව
අංක 5

# මහජනයාගෙන් තැන්පතු ගැනීමට බලය ලත් ආයතන



මෙම පත්‍රිකාවේ අරමුණ වන්නේ මහජනයාගෙන් තැන්පතු භාරගැනීමට නීතිමය බලතල ලබා ඇති විවිධ ආයතන කාණ්ඩයන් පිළිබඳව මහජනයා දැනුවත් කිරීමය. එමෙන්ම, මෙම පත්‍රිකාව "තැන්පතුව" යන්නෙහි අර්ථය නිර්වචනය කරන අතර, ඇතැම් අවසර නොලත් ආයතන විසින් "ආයෝජන" හෝ "ණය" ආදී විවිධ නම් භාවිතා කරමින් මහජනයාගෙන් මුදල් රැස් කිරීමට කරන උත්සාහයන් පිළිබඳව මහජනයාට අනතුරු හඟවයි..

ශ්‍රී ලංකා මහ බැංකුව

මැයි 2006

# මහජනයාගෙන් තැන්පතු භාරගැනීමට බලය ලත් ආයතන

මහජනයාගෙන් මුදල් තැන්පතු ලබාගැනීමට නීතියෙන් බලය පවරා ඇත්තේ ආයතන කාණ්ඩ කිහිපයකට පමණි. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලියාපදිංචි මුදල් සමාගම්වලට තැන්පතු ලබාගැනීම සඳහා පවතින නීති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දී ඇත. එසේ වුවත් තැන්පතු ලබා ගැනීම සඳහා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගැනීමේ හෝ මහ බැංකුව වෙත ලියාපදිංචි වීමේ හෝ අවශ්‍යතාවයෙන් 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි වූ සමුපකාර සමිති සහ ජාතික නිවාස පනත යටතේ සංස්ථාපනය කරන ලද ගොඩනැගිලි සමිති නිදහස් කර ඇත. වැඩිදුරටත්, යම්කිසි නීතියක් යටතේ පිහිටුවන ලද ලාභ ඉපැයීම පරමාර්ථ කර නොගත් සංවිධානයකට, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ ලිඛිත අවසරය සහිතව, සිය සාමාජිකයන්ගෙන් පමණක් තැන්පතු භාරගත හැක.

2005 අංක 2 දරන බැංකු (සංශෝධන) පනතින් සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ, පහත දැක්වෙන පරිදි "තැන්පතුව" නිර්වචනය කර ඇත.

> *"තැන්පතුව" යන්නට, ඉල්ලා සිටි විටෙක හෝ යම් මතු දිනයකදී නැතහොත් ගෙවීම කරන තැනැත්තා සහ ගෙවීම් භාරගන්නා තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තන් වෙනුවෙන් එකඟ වූ අවස්ථාවන් මත පොලියක් හෝ අධි මිලක් සහිතව හෝ රහිතව, එය ආපසු ගෙවනු ලබන්නේ කවර නියමයන් යටතේද ඒ නියමයන් මත, ව්‍යාපාරයක් ලෙස යම් තැනැත්තකුගෙන් භාරගනු ලබන මුදලක් ඇතුළත් වේ. එසේ වුවද මුදල් භාර ගන්නා තැනැත්තා, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල කොටසක් ලෙස මුදල් ණයට දෙන තැනැත්තකු හෝ එසේ භාරගන්නා ලද මුදල් ප්‍රයෝජනයට ගැනීමට හෝ එහි අර්ථලාභය ලැබීමට තුන්වන පාර්ශවයකට ඉඩ සලසන තැනැත්තෙකු හෝ විය යුතු අතර, තැන්පතුව යන්නට බැංකු පනතේ (II) උප ලේඛනයෙහි (ම) ඡේදයෙන් සහ (IV) උපලේඛනයෙහි (ගග) ඡේදයෙන් විධිවිධාන සපයා ඇති පරිදි භාරගත් යම් මුදලක්ද ඇතුලත් වේ.*

බැංකු පනතේ (II) උපලේඛනයෙහි (ම) ඡේදයෙන් සහ (IV) උපලේඛනයෙහි (ගග) ඡේදයෙන් තැන්පතු ස්වභාවයෙන් යුතු ඉස්ලාමීය බැංකු සේවා විස්තර කෙරේ.

තැන්පතු ලබා ගැනීමට නීතියෙන් බලය නොලත් සමහර ආයතනයන්, "ආයෝජන" "ණය ගැනීම්" හෝ "ආයෝජනය කිරීම සඳහා පැවරීම්" ආදී නම් භාවිතා කරමින් මහජනයාගෙන් මුදල් රැස් කරන බව මහ බැංකුවේ අවධානයට යොමු කර ඇත. යම්කිසි මුදල් රැස්කිරීමේ ක්‍රමයක ඉහත නිර්වචනයෙහි සඳහන් ලක්ෂණ තිබේ නම්, එබඳු ක්‍රමයක් යටතේ කවර නමක් භාවිතා කරමින් මුදල් රැස් කළත්, එය තැන්පතු භාර ගැනීමක් වේ.

"බැංකු" හෝ "මුදල් සමාගම්" හෝ ඒ හා සමාන නම් වලින් තමන් හඳුන්වා ගන්නා බොහෝ බලය නොලත් ආයතන මහජනයාගෙන් තැන්පතු ලබා ගැනීම සඳහා ඉතා ඉහළ පොලී අනුපාතික පිරිනැමීම නිතර සිදුවන්නකි. මෙවැනි සමහර ආයතන අසාර්ථක වී බංකොලොත් වී ඇති අතර, එම ආයතනයන්හි මුදල් ආයොජනය කළ ජනතාවට සිය මුදල් අහිමිව ඇත. එමෙන්ම, මහජන තැන්පතු භාරගැනීමට අවසරයක් නොලද ඇතැම් ආයතන, සමාගම් පනත යටතේ ලියාපදිංචි වීම මගින් තැන්පතු භාරගැනීම සඳහා තමන්ට බලය ලැබී ඇති බව ප්‍රකාශ කරමින් මහජනයා මුලා කරන බව මහ බැංකුවට දැන ගන්නට ලැබී ඇත. එබඳු ප්‍රකාශයන්ගෙන් මුලා නොවන සේ මහජනයාට දැනුම් දෙනු ලැබේ.

තොරතුරු හරියාකාර දැනගෙන ආයෝජන තීරණයන් ගැනීමට මහජනයාට ඇති හැකියාව වැඩි කිරීම සඳහා, මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සහ ලියාපදිංචි මුදල් සමාගම් සඳහා තොරතුරු හෙළි කිරීමේ නියමයන් හඳුන්වා දී ඇත. බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සිය විගණනය කළ ගිණුම් පුවත්පත්වල පළකළ යුතු වේ. ලියාපදිංචි මුදල් සමාගම් විසින්, මුදල් වර්ෂයක් ගෙවී මාස 6 ක් ඇතුළත සිය විගණනය කළ වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත් කළ යුතු වේ. වැඩිදුරටත්, මුදල් සමාගම් විසින්, තැන්පතු රැස්කිරීම සඳහා පළකරන වෙළෙඳ දැන්වීම්වල, මෑත වර්ෂ තුන සඳහා වූ විගණනය කළ ශේෂ පත්‍රවල වාර්තා වූ ප්‍රාග්ධන ප්‍රමාණය, තැන්පතු හා එම සමාගම්වල ණය ගැනීම් පළ කළ යුතුවේ.

බලපත්‍රලාභී බැංකු සහ ලියාපදිංචි මුදල් සමාගම් විසින් සිය ප්‍රධාන කාර්යාලයෙහි සහ ව්‍යාපාරික ස්ථානයෙහි මහ බැංකුව විසින් නිකුත් කළ බලපත්‍රය ප්‍රදර්ශනය කළ යුතු වේ. යම්කිසි ලියාපදිංචි මුදල් සමාගමකට හෝ බලපත්‍ර ලාභී වාණිජ බැංකුවකට හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස කිසියම් ආයතනයක් මහජන මුදල් රැස් කිරීමේ නිරත වන්නේ නම් ඒ ආයතනයට තැන්පතු ලබා ගැනීමට ඇති බලය පිළිබඳ කිසියම් අයෙකුට සැකයක් ඇති වුවහොත් එම ආයතනයට මහ බැංකුවෙන් නිකුත් කර ඇති බලපත්‍රය පෙන්වන ලෙස ඉල්ලා සිටිය හැක. එ මෙන්ම සිය ආයතනයෙහි මුදල් තැන්පත් කරන ලෙස මහජනයාට ආරාධනය කරන වෙනත් සංවිධානයකින් ද, තැන්පතු භාරගැනීමට බලය ලබා දෙන ලියකියවිලි පෙන්වන ලෙස ඉල්ලා සිටිය හැක.

ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී බැංකු සහ ලියාපදිංචි මුදල් සමාගම් අධීක්ෂණය කරයි. අදාළ ආයතනයන්ගෙන් ලබාගත් තොරතුරු විශ්ලේෂණය කෙරෙන දුරස්ථ පරීක්ෂණයන් සහ පොත්පත් සහ ගිණුම් පරීක්ෂණය කරන එතැන් පරීක්ෂණයන් ද මීට ඇතුලත් වේ. මෙම අධීක්ෂණයන්හි අරමුණ වන්නේ මෙම ආයතන සිය කටයුතු විචක්ෂණශීලි ලෙස පවත්වාගෙන යන්නේද යන්න සහ මහජනයා විසින් එම ආයතනයන්හි තැන්පත් කළ මුදල් නිසි පරීක්ෂාකාරීත්වයකින් පරිහරණය කරන්නේද යන්න පිළිබඳව සහතික වීමය. කෙසේ වෙතත්, මහ බැංකුව මෙම ආයතන කළමනාකරණය නොකරන අතර, එහි අධීක්ෂණය මගින් තැන්පතුවල ආරක්ෂාව පිළිබඳව සහතික වීමක් ද සිදු නොවේ.

මහජනයාගෙන් තැන්පතු භාරගැනීමට බලය ලත් ආයතනයන්හි නම් සඳහන් ලැයිස්තුවක් මහ බැංකුව විසින් මහජනයාගේ දැනගැනීම සඳහා කලින් කලට පළකරනු ලැබේ. 2006 මැයි 31 දිනට බැංකු පනත යටතේ බලපත්‍ර ලබාදෙන ලද බැංකු සහ මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කර බලපත්‍ර ලබාදෙන ලද මුදල් සමාගම්වල නම් ලැයිස්තුවක් පහත දැක්වේ.

## බලපත්‍රලාභී වාණීජ බැංකු (අකාරාදී අනු පිළිවෙලට)

1. අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ්
2. ඉන්දියන් ඕවර්සීස් බැංකුව
3. ඉන්දියන් බැංකුව
4. එම්සීබී බැන්ක් ලිමිටඩ්
5. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්
6. ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් ලිමිටඩ්
7. ඩොයිෂ් බැංකුව ඒ.ජී.
8. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
9. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
10. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්
11. පබ්ලික් බැන්ක් බර්හාඩ්
12. පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
13. මහජන බැංකුව
14. යුනියන් බැන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ්
15. යුනියන් බැන්ක් ලිමිටඩ් (පකිස්ථානයේ සංස්ථාගත කරන ලද)
16. ලංකා බැංකුව
17. ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව
18. ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
19. සිටි බැන්ක්, එන්.ඒ.
20. සීමාසහිත හබීබ් බැංකුව
21. සීමාසහිත හැටන් නැෂනල් බැංකුව
22. සීමාසහිත සම්පත් බැංකුව
23. සෙලාන් බැන්ක් ලිමිටඩ්

## බලපත්‍රලාභී විශේෂිත බැංකු (අකාරාදී අනු පිළිවෙලට)

1. ඌව සංවර්ධන බැංකුව
2. එන්ඩීබී හවුසිං බැන්ක් ලිමිටඩ්
3. එස් එම් ඊ බැන්ක් ලිමිටඩ්
4. කඳුරට සංවර්ධන බැංකුව
5. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
6. ඩීඑෆ්සීසී බැංකුව
7. රජරට සංවර්ධන බැංකුව
8. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
9. රුහුණු සංවර්ධන බැංකුව
10. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්*
11. වයඹ සංවර්ධන බැංකුව
12. සණස ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
13. සබරගමුව සංවර්ධන බැංකුව
14. සෙලින්කෝ සේවින්ස් බැන්ක් ලිමිටඩ්
15. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

*2006 මැයි මාසයේ දී බලපත්‍රය නිකුත් කළ මුත් මැයි මස අවසානය වන විට බැංකු කටයුතු ආරම්භ කර නොතිබුණි.

## ලියාපදිංචි මුදල් සමාගම් (අකාරාදී අනු පිළිවෙලට)

1. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
2. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
3. ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ්
4. එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
5. එල්.බී.ෆිනෑන්ස් ලිමිටඩ්
6. එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
7. ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්
8. කොමර්ෂල් ක්‍රෙඩිට් ලිමිටඩ්
9. චිලව් ෆිනෑන්ස් ලිමිටඩ්
10. ජනශක්ති ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
11. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
12. ද මල්ටි ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
13. ද ෆිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි කම්පැනි ලිමිටඩ්
14. ද ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
15. නන්ද ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
16. බාට්ලීට් ෆිනෑන්ස් ලිමිටඩ්
17. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
18. මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්
19. ලංකා ඔරික්ස් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
20. වැලිබල් ෆිනෑන්ස් ලිමිටඩ්
21. සිංගර් ෆිනෑන්ස් (ලංකා) ලිමිටඩ්
22. සිංහපුත්‍ර ෆිනෑන්ස් ලිමිටඩ්
23. සිල්වරීන් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
24. සෙංකඩගල ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
25. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්
26. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
27. සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් රියල්ටි ලිමිටඩ්
28. ෆිනෑන්ස් ඇන්ඩ් ලෑන්ඩ් සේල්ස් ලිමිටඩ්

### වැඩිදුර විස්තර සඳහා:

**බැංකු නො වන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**30, ජනාධිපති මාවත, කොළඹ 1**
**දුරකථන: 2477500, 2477504, 2477021, 2477495**
**ෆැක්ස්: 2477738**
**විද්‍යුත් තැපෑල: snbfi@cbsl.lk**

**බැංක අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**30, ජනාධිපති මාවත, කොළඹ 1**
**දුරකථන: 2477100, 2477135, 2477468, 2477096**
**ෆැක්ස්: 2477711**
**විද්‍යුත් තැපෑල: banksup@cbsl.lk**

**ප්‍රකාශන අලෙවි කවුළුව**
**මහ බැංකු අධ්‍යයන කේන්ද්‍රය**
**58, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය**
**දුරකථන: 2477829, 2477803**

මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී